සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

තෙවන වාර පරීක්ෂණය
**மூன்றாம் கால சோதனை - 2026**
**Third Term Test**

| ශ්‍රේණිය / தரம் / Grade | 13 | විෂයය / பாடம் / Subject | බෞද්ධ ශිෂ්ටාචාරය | පත්‍රය / வினாத்தாள் / Paper | II | පැය / மணித்தியாலம் / Hours | 3 |
|---|---|---|---|---|---|---|---|

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

**උපදෙස් :**

* I කොටසින් ප්‍රශ්න **දෙකක්ද, II** කොටසින් ප්‍රශ්න **තුනක්ද** තෝරා ගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් හිමි වේ.

## I කොටස

1. i. ක්ෂත්‍රිය වර්ණයට නියමිත ස්වධර්ම හතරක් නම් කරන්න. (ලකුණු 02)

   ii. බ්‍රාහ්මණ සංස්කෘතියේ අනන්‍යතා ලක්ෂණ තුනක් ගෙන හැර දක්වන්න. (ලකුණු 03)

   iii. බුද්ධ කාලීන භාරතයේ පැවති සමූහාණ්ඩු (ගණතන්ත්‍ර) පාලනය පිළිබඳ කෙටි විවරණයක් සපයන්න. (ලකුණු 04)

   iv. බෞද්ධ සමාජය තුළ මාතෘත්වය උසස් කොට සලකා ඇති අයුරු නිදසුන් මඟින් පහදන්න. (ලකුණු 05)

   v. අජිත කේසකම්බල ගේ ආගමික ඉගැන්වීම් මඟින් සමාජ සදාචාරයට ඇති කරන අහිතකර බලපෑම පෙන්වා දෙන්න. (ලකුණු 06)

2. i. විජ්ජාචරණ සම්පන්න බුදු ගුණය හඳුන්වන්න. (ලකුණු 02)

   ii. බුදු රජාණන් වහන්සේ සතු වූ සර්වඥතා ඥානය සැකෙවින් හඳුන්වා දෙන්න. (ලකුණු 03)

   iii. උපමාරූපක මඟින් දහම් කරුණු පැහැදිලි කිරීමට බුදු රජාණන් වහන්සේ දැක්වූ කුසලතාවය නිදසුන් හතරකින් පෙන්වා දෙන්න. (ලකුණු 04)

   iv. සැරියුත් හිමියන් සතුව පැවති චරිත ලක්ෂණ තුළින් ලැබිය හැකි ආදර්ශ පහක් පෙන්වා දෙන්න. (ලකුණු 05)

   v. අල්පේච්ඡ දිවියකට හුරුවීමෙන් පුද්ගලයාට ලැබෙන ප්‍රයෝජන පිළිබඳ විසීමක් කරන්න. (ලකුණු 06)

3. i. න පරේසං විලෝමානි ........... යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 02 යි)

ii. ඉහත (i) ගාථාවෙහි තේරුම ලියන්න. (ලකුණු 03 යි)

iii. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි දෙමාපිය දූ දරු යුතුකම් හා වගකීම් දහය නම් කර දක්වන්න. (ලකුණු 04 යි)

iv. සතර සංග්‍රහ වස්තුවල ඇති සමාජමය වටිනාකම පෙන්වා දෙන්න. (ලකුණු 05 යි)

v. පුද්ගල ක්‍රියාකාරීත්වය පදනම් කර ගෙන මෙලොව ජීවිතයේ පරිහානිය සිදු වන අයුරු පරාභව සූත්‍රාගත කරුණු මඟින් සනාථ කරන්න. (ලකුණු 06 යි)

## II කොටස

4. i. බ්‍රාහ්මණ වර්ණ භේදය පදනම් විරහිත වූවක් බව බෞද්ධ මූලාශ්‍රය සාධක ඇසුරින් තහවුරු කරන්න. (ලකුණු 10 යි)

ii. බුදු දහම යනු පුද්ගල ස්වාමීත්වයට හා ස්වඡන්දතාවයට මග පෙන්වන දහමක් බව සනිදර්ශනාත්මකව පහදන්න. (ලකුණු 10 යි)

5. i. නූතන සමාජය මුහුණ දී ඇති පාරිසරික ගැටළු අවම කර ගැනීමට පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්වල කාලීන වැදගත්කම පරීක්ෂා කරන්න. (ලකුණු 10 යි)

ii. නිවැරදි ධන කළමනාකරණයක් සඳහා ආර්ථික සුරක්ෂිතතාවයේ ඇති වැදගත්කම බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් ප්‍රකට කරන්න. (ලකුණු 10 යි)

6. i. දෙවන ධර්ම සංගායනාව පිළිබඳව සැකෙවින් හඳුන්වා එය ශාසන ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයක් ලෙස සැලකිය හැක්කේ ඇයි දැයි පෙන්වා දෙන්න. (ලකුණු 10 යි)

ii. බුදු සසුනේ චිරස්ථිතිය විෂයෙහිලා ධර්මාශෝක රජුගෙන් සිදු වූ සේවය අගය කරන්න. (ලකුණු 10 යි)

7. i. අභයගිරි සම්ප්‍රදායේ ප්‍රභවය ලක්දිව නව ආගමික හා ශාසනික ප්‍රබෝධයක් ඇති කිරීමට සමත් වූ ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 10 යි)

ii. බුදු දහමේ ආභාෂය ඇතිව තායි (සියමය) සංස්කෘතිය තුළ ඇති වූ නව පුනරුදය පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 10 යි)

8. i. භාරතීය බුද්ධ ප්‍රතිමා කලාවේ සමාරම්භය පිළිබඳව ඇති විවිධ මතවාද සැකෙවින් දක්වා ගන්ධාර - මථුරා ප්‍රතිමා සම්ප්‍රධායන්හි විශේෂ ලක්ෂණ හඳුන්වා දෙන්න. (ලකුණු 10 යි)

ii. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකකට විවරණ සපයන්න.

I. තාදී ගුණය
II. වලභී විශ්ව විද්‍යාලය
III. මහා විහාරය
IV. සඳකඩ පහන (ලකුණු 05 x 02 = 10 යි)